**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 28 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල උපචිත වියදම් රු. 256,962 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | වරද නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබුණු එකතුව රු. 117,680 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වර්ෂයට අදාල ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම සකස් කිරීමේදී එම වත්කම් ප්‍රාග්ධනිත කිරීමට සටහන් කර ගතිමි. |
| (ඇ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලද රු. 33,300 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රයක් වත්කම් මිලදී ගැනීම හා පරිත්‍යාග යටතේ දෙවරක් ප්‍රාග්ධනිත කර තිබුණි. | වර්ෂයට අදාල ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ඈ) | එකතු වටිනාකම රු. 64,932 ක් වූ ආයුර්වේද ඖෂධ වර්ග 33 ක තොගයක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මූලධන ආධාර එකතුව රු. 2,193,910 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල ජංගම වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට උපදෙස් දුනිමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාල ණයහිමියෝ රු. 946,692 ක් අඩුවෙන් වෙන් කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (උ) | ගිණුම් විෂයයන් 05 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන සැසඳිය යුතුවේ. | ලේඛන නැවත තුලනය කර නිවැරදි කිරීමටත් , ඒ අනුව 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී මෙම |

| | |
|---|---|
| උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 3,853,383 ක වෙනසක් විය. | වෙනස්කම් නිවැරදි කිරීමටත් උපදෙස් දුනිමි. |

**1.4 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 1995 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලය තුල අවස්ථා 73 කදී දෙන ලද රු. 2,202,498 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 1995 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ දෙන ලද අත්තිකාරම් පියවීම සඳහා තොරතුරු ලබා ගැනීම අපහසු වී ඇත.<br>අනෙකුත් අත්තිකාරම් සම්බන්ධවද තොරතුරු පරීක්ෂා කිරීම සිදුකරමින් පවතී. එම තොරතුරු ලැබුනු පසුව පියවීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,498,730 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,589,017 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,716,500 | 8,911,406 | 7,025,062 | 15,858,134 | 8,477,000 | 9,023,814 | 8,573,527 | 13,490,044 |
| (ii) | කුලී | 9,177,600 | 8,558,020 | 8,562,817 | 682,884 | 6,738,900 | 7,033,416 | 7,216,722 | 685,781 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,122,300 | 1,042,271 | 1,051,621 | 5,750 | 881,650 | 1,035,707 | 1,007,807 | 91,000 |
| (iv) | වෙනත් ආදායම් | 24,580,400 | 24,083,720 | 20,802,729 | 23,407,099 | 23,638,500 | 22,981,403 | 33,438,251 | 20,002,855 |

**2.2.2** **වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) (i) | වරිපනම් බදු අයකිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වසර 05 කට වරක් තක්සේරු කල යුතු වුවත්, 2012 වර්ෂයෙන් පසු දේපල තක්සේරුවක් සිදුකර නොතිබුණි. | වර්ෂ 05 කට වරක් දේපල තක්සේරු කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2017 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කලද, ඔවුන් විසින් මුළු වරිපනම් බල ප්‍රදේශය තුළම සමීක්ෂණයක් කර ලැයිස්තු සකස් කරන ලෙස දන්වා ඇත. ඒ අනුව සමීක්ෂණ කටයුතු ආරම්භ කලද නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් මේ වන විට එය සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය. ලබන වර්ෂයේ මෙම කටයුතු අවසන් කිරීමට අවශ්‍ය කටයුතු දැනට කර ගෙන යනු ලැබේ. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 8,783,798 ක් වූ අතර, ඒ තුල වසර 03 ට වඩා වැඩි කාලයක් හිඟහිට ඇති ඒකක 4,156 කට අදාල එකතුව රු. 4,843,624 ක් පැවතුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙහි 158(1) වගන්තිය ප්‍රකාරව හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | සභා බල ප්‍රදේශය තුළ වරිපනම් ඒකක 7000 කට අධික ප්‍රමාණයක් පවත්නා අතර, ඒ සඳහා ආදායම් පරීක්ෂකවරු සිටිනුයේ එක් අයෙක් පමණි. එසේම අලුතින් දියුණු ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ වලින් වැඩි ප්‍රමාණයක් තුළ පාරිභෝගිකයින්ට ලබාදිය යුතු පහසුකම් ලබාදීමට නොහැකිවීම හේතුවෙන් අදාල පුද්ගලයින් වරිපනම් බදු ගෙවීම ප්‍රතික්ෂේප කර ඇත. හිඟ ආදායම් අය කිරීමට ඉදිරියේ දී කටයුතු කරමි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු. 205,274 ක් වූ අතර, ඒ තුල වර්ෂ 05 ට වඩා වැඩි කාලයක් හිඟහිට ඇති ඒකක 140 කට අදාල එකතුව රු. 170,429 ක් පැවතුණි. | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අක්කර බදු සතොයක්ෂණය සිදු කිරීම හා ආදායම් පරීක්ෂකවරුන් වෙත හිඟ ලැයිස්තු ලබාදීම මගින් මෙම මුදල් අයකර ගැනීමට බලාපොරොත්තු වෙමි. |

**2.2.3** **බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරික ස්ථාන 29 ක් බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් සභාවට රු. 127,600 ක ආදායමක් අහිමි වී තිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගතයුතු සියළු ආයතන වෙත විධිමත්ව බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | පරිසර බලපත්‍රවල කාල සීමාව ඉක්මවා ගොස් ඇති කර්මාන්ත සඳහා යලි බලපත්‍රය අලුත් කර ගන්නා ලෙස දන්වා ඇති අතර, ඉදිරියේදී බල ප්‍රදේශයේ සියලුම කර්මාන්ත පිළිබඳ සොයා බලා පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත පිළිබඳව කටයුතු කරන බව දන්වා සිටිමි. |

### 2.2.4 වෙනත් ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගාස්තු නොගෙවා සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු හඳුනාගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුල සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාලව රු. 49,870 ක් අයවීමට තිබුණු ස්ථිර දැන්වීම් පුවරු 08 ක් ගාස්තු අයකර ගැනීමකින් තොරව ගලවා ඉවත් කර තිබුණි. | සභාවට අයවිය යුතු සියළු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2017 වසරේ සිදුකළ සමීක්ෂණය පදනම් කරගෙන ස්ථිර දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකර ගෙන ඇති අතර ඊට අමතරව අලුතින් සවිකර ඇති දැන්වීම් පුවරු සඳහා විස්තර ලබාගෙන ඇත. |
| (ආ) | සභාවට අයත් ඇහැලියගොඩ එළුමස් හා කුකුල් මස් වෙළඳසැල් වලින් 2013 හා 2015 වර්ෂ වලට අදාලව අයවිය යුතු රු. 352,209 ක කඩකුලී අයකර ගෙන නොතිබුණි. | වෙළඳසැල් බාහිර පාර්ශවයන්ට බදු දීමේදී නිසි පරිදි ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතුවේ. | ඇහැලියගොඩ නගර සංවර්ධන කටයුතු නිසා සතිපොල භූමිය තුළ අදාල කඩ කාමර පවත්වාගෙන යාම අවිනිශ්චිත වූ හෙයින් අදාල කඩ කාමර සඳහා දෛනික පදනම මත මුදල් අයකර ඇති අතර, ගිවිසුම් ගත වීමක් සිදු වී නොමැති බව අදාල ලිපිගොනු පරීක්ෂා කිරීමේදී තහවුරු විය. එබැවින් හිඟ මුදල් අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ගැටළු සහගත නිසා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව හිඟ මුදල් ලේඛණවලින් කපා හැරීම සඳහා කටයුතු කරමින් පවතී. |
| (ඇ) | ඇහැලියගොඩ සතිපොල සම්බන්ධයෙන් වූ අධිකරණ තීන්දුව ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වනවිට බදුකරුගෙන් තවදුරටත් අයවිය යුතු මුදල රු. 180,000 ක් විය. | අධිකරණ තීන්දුව අනුව කටයුතු කළ යුතුවේ. | අදාල මුදල් අය කර ගැනීම සඳහා පවරා ඇති නඩුව නැවත කැඳවීමට කටයුතු කර ඇති බැවින් අධිකරණ තීරණය මත ඉදිරි කටයුතු සිදු කරමි. |

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අයවිය යුතු උසාවි දඩ රු. 3,454,370 ක් වූ අතර, අයවිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන නොතිබුණි. | සභාව වෙත ලැබිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ඊට අදාල උප ලේඛන නොලැබීම හේතුවෙන් නිශ්චිත මුදලක් බිල් කිරීමට නොහැකිවී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන් 15 ක් ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත්වී තිබුණි. | බල ප්‍රදේශය තුල සිදුකල යුතු සංවර්ධන කටයුතු වල ප්‍රමුඛතාවය හඳුනාගෙන සැලසුම් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | 2018 ක්‍රියාකාරී සැලැස්ම දේශපාලන අධිකාරිය නොමැති කාලය තුළ සැකසුමක් නිසා දේශපාලන අධිකාරියේ ප්‍රමුඛතාවය හා සභාවේ මූල්‍යමය තත්ත්වය අනුව යම් යම් කරුණු ක්‍රියාත්මක කිරීමට වූ බව සඳහන් කරමි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | සභාව විසින් රැස් කරන දිරන හා නොදිරන කසළ බේරුවාන ප්‍රදේශයේ අක්කරයක පමණ විවෘත භූමියකට අවිධිමත්ව බැහැර කිරීම හේතුවෙන් දැඩි පාරිසරික හානියක් සිදුව තිබුණි. | විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | දෛනිකව ප්‍රාදේශීය සභාව විසින් කසළ ටොන් 04 – 05 ක ප්‍රමාණයක් එකතු කර බේරුවාන කොම්පෝස්ට් අංගනයට බැහැර කරනු ලබන අතර ඒ සඳහා ඇති භූමිය ප්‍රමාණවත් නොවීම නිසා ඊට යාබදව තවත් අක්කර 02 ක් පමණ ලබාදෙන ලෙස ඉල්ලා ඇතත් මේ වන තෙක් එම ඉල්ලීම ඉටු වී නොමැත. මේ |

| | | | |
|---|---|---|---|
| | | | වන විට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා ගෙන එන කසල තෝරා වෙනවෙනම ගොඩගසා ඇත. අනෙකුත් කසල බැකෝ යන්ත්‍රය මගින් පස් දමා යට කිරීම සිදු කරමි. |
| (ii) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix) (ආ) වගන්තිය ප්‍රකාරව මලාපවාහනය, කසළ ශෝධනය හා ඒ සඳහා ගාස්තු අයකිරීමට අතුරු ව්‍යවස්ථා පනවාගෙන ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යාවස්ථාවක් පැනවීම සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරමි. |

**(ඇ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධනයට අදාල දිගුකාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට 1 කට සමාන බද්දක් අයකල යුතු වුවත්, 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලය තුල ඉඩම් වෙන්දේසි 07 කින් තාවකාලික තක්සේරුව මත පදනම්ව සියයට 1 සමාන වූ එකතුව රු. 762,920 ක් පමණක් අයකර ගෙන තිබුණි. | සභාව වෙත ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | එම ඉඩම් වල සත්‍ය වටිනාකම සොයාගෙන විකුණුම් මිලේ වෙනසක් සිදුවී ඇත්නම් අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. |
| (ආ) | දිවුරුම්පිටිය නරියාමුල්ලහේන ඉඩම් වෙන්දේසියේදී පොදු කටයුතු සඳහා වෙන් කල භූමියෙන් පර්චස් 22.61 ක් අඩුවෙන් සභාවට පවරා දී තිබුණි. | සභාව වෙත ලැබිය යුතු ඉඩම් කොටස් ලබා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුයි. | එම ඉඩම් කොටස ලබාදෙන ලෙස වෙන්දේසිකරු දැනුවත් කළද ඔහු ඒ සම්බන්ධව පියවර නොගත් නිසා, තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ඉඩමේ වටිනාකම තක්සේරුකර දන්වන ලෙස ලිපි මඟින් දන්වා ඇත. එම |

| | | |
|---|---|---|
| | | වටිනාකම ලැබුණ පසු වෙන්දේසිකරුගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට හිඟහිට ඇති නිලධාරීන් 07 දෙනෙකුට අදාල එකතුව රු. 56,654 ක් වූ ණය ශේෂ 2019 අප්‍රේල් වනවිටද අය කරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකරගත යුතුවේ. | මේ වන විට අය කර ගැනීමට ඇති හිඟය රු.56,064 කි. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව නඩත්තු කර නොතිබීම නිසා සභාව සතු සියළුම ජංගම නොවන වත්කම් වල වටිනාකම තහවුරු කරගත නොහැකි විය. | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව නඩත්තු කළ යුතුවේ. | ඇතැම් ස්ථාවර වත්කම් විවිධ ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබී ඇත. තවද එම වත්කම් සඳහා තක්සේරුවක් මෙතෙක් කර නොමැති බැවින් එම වත්කම් පිළිබඳව ස්ථාවර වත්කම් ලේඛනයේ වටිනාකම් සඳහන් කර නැත. |

### 3.5 ප්‍රසම්පාදනය

#### 3.5.1 සැපයීම් හා සේවා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිවුරුම්පිටිය ජල යෝජනා ක්‍රමය යටතේ ජලය ලබා ගැනීමට 2018 ඔක්තෝබර් වනවිට අයදුම්පත් 95 ක් පමණක් ලැබී තිබුණද, 2017 ඔක්තෝබර් මස රු.656,250 ක් වැයකර ජල මනු 350 ක් එකවර මිලදී ගෙන තිබුණි. ඉන් වටිනාකම රු. 568,125 ක් වූ ජල මනු 303 ක් වර්ෂයකට අධික කාලයක් නිෂ්කාර්යව තිබුණු අතර, ඒවායේ වගකීම් කාලයද අවසන් වී තිබුණි. | භාණ්ඩ මිලදී ගැනීමට පෙර අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගත යුතුවේ. | ඇස්තමේන්තු කරන අවස්ථාවේ දී නිවාස 350 කට පමණ ජලය අවශ්‍යව තිබුණු අතර, ජල මීටර මිලදී ගැනීමෙන් පසු මෙම ප්‍රදේශයට ජල සම්පාදන මණ්ඩලයෙන් ද ජල නල එලා ජලය ලබා දීම හේතුවෙන් අපේක්ෂිත ජල සම්බන්ධතා ප්‍රමාණය ලබා දීමට නොහැකි විය. ඉදිරියේදී දිවුරුම්පිටිය වත්ත ජල යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීමට යෝජිත අතර එහි මෙම ජල මීටර සවි කිරීමට හැකි වනු ඇත. |
| (ආ) | 2018 පෙබරවාරි මිලදී ගෙන තිබුණු රු. 676,750 ක් වටිනා පරිගණක 05 ක්, වරිපනම් මෘදුකාංග පද්ධතිය හා | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ | ඉදිරියේදී තාක්ෂණික පිරිවිතර ඇගයීමක් සිදුකර මිලදී ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | ඡායාපිටපත් යන්ත්‍රවල තාක්ෂණික පිරිවිතර ඇගයීමක් සිදු නොකර අවම මිල මත පදනම්ව ප්‍රසම්පාදනය පිරිනමා තිබීම හේතුවෙන් ප්‍රශස්ථ මිලට සුදුසුම භාණ්ඩය මිලදී ගෙන තිබේද යන්න විගණනයට තහවුරු නොවීය. | යුතුවේ. | |

**3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ)(i) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ප්‍රදේශ වල මාර්ග කිලෝමීටර් 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2017 යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල සීමාව තුල මාර්ග සංවර්ධන ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2017 අගෝස්තු 02 දින රු. 58,905,292 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. සුදුසුකම් සහිත කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙන කොන්ත්‍රාත් පැවරීමට සභාව කටයුතු කර නොතිබීම හේතුවෙන් නියමිත දිනට ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි වී තිබූ අතර, 2018 නොවැම්බර් මස ප්‍රතිපාදන ආපසු පවරා ගෙන තිබුණි. | ලැබී ඇති ප්‍රතිපාදන පළාතේ සංවර්ධනය සඳහා ඵලදායී ලෙස උපයෝජනයට අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගතයුතු වේ. | පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව ඉහත ව්‍යාපෘති දෙක සඳහා ප්‍රසම්පාදන දැන්වීමක් පළකර 2017 සැප්තැම්බර් 11 දින දක්වා ලංසු කැඳවන ලදී. පසුව ප්‍රධාන අමාත්‍යාංශයේ 2017 සැප්තැම්බර් 29 දිනැති ලිපියට අනුව මෙම ව්‍යාපෘති 02 සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත පවරා ඉටුකර ගැනීමට තීරණය කරන ලදී. ඉතා කෙටි කාලසීමාවක් තුල ව්‍යාපෘති දෙක ඉටු කළ යුතු වීම හා පළාත් පාලන ඉංජිනේරුවරයා ස්ථාන මාරු වී යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී. |
| (ii) | ඉහත ව්‍යාපෘති 02 හි අවලංගු කිරීමේ තීරණය ගන්නා විට එම මාර්ග වලින් සියයට 25 ට අඩු ප්‍රමාණයක වැඩ සිදුකර තිබුණු බැවින් ඒ සඳහා වැයකර තිබූ රු. 13,054,363 ක මුදල ලැබීමේ අවදානමක් පැවතුණි. | ඉතිරි වැඩ නිම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගෙන ඵලදායී ලෙස කර්මාන්ත දෙක නිම කිරීමට කටයුතු කළ යුතුවේ. | 2017 වර්ෂයේ අධික ලෙස වර්ෂාපතනය පැවති හෙයින් කිහිපවතාවක්ම ඉහත ව්‍යාපෘති දෙකෙහි ගිවිසුම් ගත කාලය දීර්ඝ කර ගැනීමට අවශ්‍ය විය. තවද එම ව්‍යාපෘති 02 ක්‍රියාත්මක කරන ප්‍රදේශය ඉතාම දුෂ්කර බැවින් නියමිත දිනවලදී ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි විය. |
| (iii) | ලංසු කැඳවීමේ දැන්වීම පළ කිරීමෙන් පසු මෙම කර්මාන්ත, සබරගමුව පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත පවරා තිබීම නිසා දැන්වීම් පළකිරීම සඳහා වැය කරන ලද රු. 120,750 ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | නිසි සැලැස්මකට අනුව මුදල් වැය කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාල ව්‍යාපෘතීන් සඳහා 2017 අගෝස්තු 17 දින පුවත්පත් දැන්වීම් පළකර ඇති අතර අයදුම්පත් නිකුත් කිරීමේ අවසන් දිනය ලෙස 2017 සැප්තැම්බර් 07 දින දක්වා තිබේ. ඒ අතරතුර මෙම ව්‍යාපෘතියට අදාල පුවත්පත් දැන්වීම හා ටෙන්ඩර් අයදුම්පත් සකස්කර දුන් පළාත් පාලන ඉංජිනේරු මහතා එම තනතුරින් නව තනතුරකට මාරුකර යවා ඇති අතර ටෙන්ඩර් කමිටුව හා තාක්ෂණික |

| | | | |
|---|---|---|---|
| | | | කමිටුව පත්කර ගැනීමේ කටයුතුද නිසි පරිදි කර ගැනීමට අපොහොසත් වී ඇත. 2017 සැප්තැම්බර් 04 දින පෙ.ව.10.00 වන විටත් කිසිදු ඉල්ලුම්කරුවෙකු මේ සඳහා ලංසු ඉදිරිපත්කර නොතිබුණි.<br>මෙම තත්ත්වය සලකා බලා පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ සහාය ලබාගැනීමට සුදුසු බව පෙනීගිය හෙයින් දුරකථනයෙන් කතාකර ඉදිරි කටයුතු සඳහා ඉහත ව්‍යාපෘති දෙක පළාත් සභාව වෙත යොමුකිරීමට කටයුතු කරන ලදී. |
| (iv) | සංවර්ධන ව්‍යාපෘති 02 ක් සඳහා ඉටුකළ වැඩ ප්‍රමාණයට වඩා වැඩියෙන් රු. 60,005 ක් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම අයකර ගත යුතුවේ. | වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 18 කට අදාලව එකතුව රු. 1,296,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමට කටයුතු කළ යුතුවේ. | අය වැය ගත කිරීමේදී වැය විෂයන්ට අදාලව ප්‍රතිපාදන වෙන් කලද නියමිත කාර්යයන් සිදු නොකළ නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 10 කට අදාලව එකතුව රු. 828,050 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 81 සිට සියයට 97 දක්වා පරාසයක ඉතිරි වීම් තිබුණි. | ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | අය වැය ගත කිරීමේදී වැය විෂයන්ට අදාලව ප්‍රතිපාදන වෙන් කලද නියමිත කාර්යයන් සිදු නොකළ නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

**4.2** **විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කළ යුතුවේ. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. |